


# ESBM

## ADVANCED CERTIFICATE IN ENTREPRENEURSHIP AND SMALL BUSINESS MANAGEMENT (ESBM)

The Open University of Sri Lanka

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
# ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය
# පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහන(ESBM)

## අධ්‍යයන වර්ෂය 2022 – 2023

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන පීඨය මඟින් පවත්වනු ලබන ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහනේ අධ්‍යයන වර්ෂ 2022 – 2023 පිළිබඳ සියළුම විස්තර මෙම අත් පොතෙහි අන්තර්ගත වේ.

මෙහි අඩංගු තොරතුරු වල නිවැරදිතාවය සහතික කරලීම සඳහා සෑම උත්සාහයක්ම දරා ඇති අතර නියෝග වල වෙනසක්, ප්‍රතිපත්තිමය වෙනසක්, මුල්‍යමය වෙනසක්, හෝ වෙනත් කරුණු හේතු කොට ගෙන ඒවා පසුකාලීනව වෙනස් කිරීම් හෝ සංශෝධනවලට භාජනය විය හැකිය.

නාවල,
නුගේගොඩ.

2022 ජුනි.

පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | ප්‍රධාන සම්බන්ධීකාරකතුමියගේ ප්‍රකාශය | 04 |
| 2. | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 05 |
| 3. | කළමනාකරණ අධ්‍යයන පීඨය | 06 |
| 4. | ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහන | 07 |
| 5. | අමතර තොරතුරු | 10 |
| 6. | වැඩිදුර විමසීම් | 18 |

## ප්‍රධාන සම්බන්ධිකාරකතුමියගේ ප්‍රකාශය

කළමනාකරණ අධ්‍යයන පීඨයේ, සංවිධාන අධ්‍යයන අංශය විසින් පිරිනමනු ලබන ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ උසස් සහතික පත්‍ර (ESBM) වැඩසටහන සඳහා ඔබ සැවොම සාදරයෙන් පිළිගනිමි. මම, ඔබ සියලුදෙනා ඉගෙනීම සඳහා ස්වෝත්සහය, හා නුදුරු අනාගතයේ ව්‍යවසායකයන් වීමේ අභිලාශය ඇති සුවිශේෂී පුද්ගලයන් ලෙස සලකමි.

ESBM වැඩසටහන, ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ සහ කළමනාකරණය කිරීමට අවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රයෝගික දැනුම සහිත, ඉහළ බුද්ධිමය හා වෘත්තීය වශයෙන් ඉහල මට්ටමේ ව්‍යවසායකයන් බිහිකිරීමේ අරමුණින් හඳුන්වා දෙන ලදී. මෙම අධ්‍යයන වැඩසටහනට උද්යෝගීව සහභාගී වීමෙන් ඔබට හඳුනා නොගත් ව්‍යාපාර අවස්ථා අනාවරණය කර ගත හැකි ආකාරය පිළිබඳ දැනුම ලබා ගැනීමටත්, තනිවම ව්‍යාපාරයක් කළමනාකරණය කර ගැනීමට සහ ව්‍යවසායකයෙකු ලෙස ඔබගේ වෘත්තිය බලාපොරොත්තු ඉටුකර ගැනීමටත් හැකි වේ.

විවෘත විශ්ව විශ්වවිද්‍යාලයෙන් ඔබට දැනුම පමණක් නොව, එහි ඔබ ලබන්නා වූ පන්නරය ඔබේ ජීවිතය සාරවත් කරනු ඇත. විවෘත හා දුරස්ථ ඉගෙනුම් මාර්ග මඟින් ඔබට සාර්ථකව ඔබගේ අධ්‍යයන කටයුතු අධ්‍යයන පරිබාහිර කාර්යයන් සහ වෙනත් කැපවීම් මනාව කළමනාකරණය කර ගනිමින් නියැලීමට අවස්ථාව උදා කරයි. OUSL හි දී ඔබට මිතුරන්, අධ්‍යාපඥනයන් හා වෘත්තිකයින් ජාලයක් සමග කටයුතු කිරීමට හැකි වනු ඇති අතර එය ඔබට ඔබගේ සාර්ථකත්වය කරා යන මඟ පෙන්වනු ඇත. අපගේ දක්ෂ හා කැපවූ අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සම්බන්ධීකාරක කණ්ඩායම සිත්ගන්නා අයුරින් බාධාවකින් තොරව ඔබ වෙත මෙම අධ්‍යයන පරිචය ලබාදීමට කැපවී සිටිති.

මම, ඔබ අප සමඟ විවෘත විශ්ව විශ්වවිද්‍යාලය රැඳී සිටින කාලය තුළ මෙම අධ්‍යයන වැඩසටහනට ඇතුළත් වීමට ඔබ ගත් තීරණයෙන් උපරිම ඵල ලබාගනිමින්, සාර්ථක ව්‍යවසායකයකු බවට පත්වන බව අපේක්ෂා කරමි.

මම, ඔබගේ සියලු අනාගත අපේක්ෂාවන් ලඟා කර ගැනීමටත් හැකියාව ලැබේවා යැයි සුභ පතමි.

ඩී. කල්පනී සෙව්වන්දි
වැඩසටහන් සම්බන්ධිකාරකතුමිය
ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර කළමනාකරණ
උසස් සහතික පත්‍ර වැඩසටහන
කළමනාකරණ අධ්‍යයන පීඨය

## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ 1980 දී පර්යේෂණ හා අධ්‍යයන කාර්යයෙහි විශිෂ්ඨත්වය උදෙසා විවෘත හා දුරස්ථ අධ්‍යාපන ක්‍රමය උපයෝගි කරගනිමින්, යාවජීව වශයෙන් වැඩිහිටි අධ්‍යාපනය සඳහා ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම මෙහෙවර කර ගනිමින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලදී. අනෙකුත් රාජ්‍ය විශ්වවිද්‍යාල සතු සියලුම නෛතික සහ ශාස්ත්‍රීය තත්ත්වයම දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මෙරට විවෘත හා දූරස්ත අධ්‍යාපන ශිල්ප ක්‍රමය යටතේ වැඩි දුර අධ්‍යාපනය ලබා ගතහැකි එකම විශ්වවිද්‍යාලය ලෙස හැඳින්විය හැකිය.

මෙහෙවර මගින් අවධාරණය කරන පරිදි ශ්‍රී ලංකා විවෘත විශ්විද්‍යාලයෙහි අධ්‍යාපන වැඩසටහන් මූලික වශයෙන් රැකියාවල නියුතු සහ වැඩිහිටි පුද්ගලයන් ඉලක්ක කර ගනිමින් නිර්මාණය කර ඇත. තමන්ට පවත්නා ඉඩ ප්‍රස්ථා අනුව සිය නිවසේ සිටියදීම සහතික පත්‍රයක් හෝ ඩිප්ලෝමාවක් හෝ උපාධියක් හෝ පශ්චාත් උපාධියක් ලබාගත හැකි වන පරිදි වැඩසහටහන් නිර්මාණය කර තිබීම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි සුවිශේෂී ලක්ෂණයක් ලෙස හඳුනා ගත හැකිය.

වර්තමානයේදී දිපව්‍යාප්තව සිටිනා 40,000 කට අධික ශිෂ්‍ය සංඛ්‍යාවකට පීඨ 06ක් (කළමනාකරණ අධ්‍යයන පීඨය, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය, ඉංජිනේරු සහ තාක්ෂණ විද්‍යා පීඨය, ස්වාභාවික විද්‍යා පීඨය, සෞඛ්‍ය විද්‍යා පීඨය සහ අධ්‍යාපන පීඨය) යටතේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් අධ්‍යපාන පාඨමාලා මෙහෙයවනු ලබයි. එසේම රටපුරා විසිරි පවතින ප්‍රාදේශීය මධ්‍යස්ථාන සහ අධ්‍යයන මධ්‍යස්ථාන ජාලය මගින් අවහිරයකින් තොරව අධ්‍යයන කටයුතු කරගෙන යාමට සිසුන්ට ඉඩ ප්‍රස්ථාව ලබා දී තිබීම සුවිශේෂී කොට දැක්විය හැක.

## කළමනාකරණ අධ්‍යයන පීඨය

කළමනාකරණ විෂයට අදාළව දැනුම, හැකියාවන් සහ ආකල්ප වර්ධනය කිරීමේ මූලික අරමුණින් **1980** දශකයේ මැද භාගයේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි මානව ශාස්ත්‍ර හා විද්‍යා පීඨයට අනුබද්ධිතව කළමනාකරණ අධ්‍යයන අංශය ආරම්භ කරන ලදී. **2019** මැයි මාසයේදී ආරම්භ කරන ලද කළමනාකරණ අධ්‍යයන පීඨය, දෙපාර්තමේන්තු හතරකින් සමන්විත වන අතර සියළුම අධ්‍යයන කටයුතු සඳහා සියලු දෙපාර්තමේන්තු සාමූහිකව වගකිව යුතු අතර මෙම දෙපාර්තමේන්තු වන්නේ සංවිධාන අධ්‍යයන අංශය, මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය, අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය සහ ගිණුම්කරණ හා මූල්‍ය අධ්‍යයන අංශයයි.

වර්තමානයේදී කළමනාකරණ පීඨයෙහි උසස් සහතික පත්‍ර පාඨමාලාවේ සිට ශාස්ත්‍රපති උපාධිය දක්වා අධ්‍යයන පාඨමාලාවන් පවත්වා ගෙන යනු ලබයි. ඒවා නම්,

- ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහන **(ESBM)**
- කළමනාකරණ ඩිප්ලෝමා වැඩසටහන **(DM)**
- කළමනාකරණ අධ්‍යයන ගෞරව උපාධි වැඩසටහන **(BMS Hons)**
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති උපාධි වැඩසටහන **(MBA in HRM)**
- පොදු රාජ්‍ය මණ්ඩලීය විධායක ව්‍යාපාර පරිපාලනපති සහ රාජ්‍ය පරිපාලනපති උපාධි වැඩසටහන් **(CEMBA / CEMPA)**

## ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහන

රටක සංවර්ධනය කෙරෙහි බලපාන අතිශය වැදගත් වන සාධකයන් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හැඳින්විය හැකිය. මෙරට ස්ථාපිත බොහෝමයක් ව්‍යාපාරික ආයතන මෙකී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අංශයට ගැනෙන අතර, එකී ව්‍යාපාර දිරි ගැන්වීම සහ නගා සිටුවීම සඳහා රජය මගින් නොයෙකුත් ක්‍රියාමාර්ග ගෙන තිබීම සුවිශේෂී කොට සැලකිය හැකිය. නමුත් ව්‍යාපාර ස්ථාපිත කිරීම සහ පරිපාලනය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් නොමැතිවීම හේතු කොට ගෙන සුහවාදී ව්‍යාපාර පරිසරයක් පැවතුනද මෙකී ව්‍යාපාර තුලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලඟා කර ගැනීමට අපහසු වී ඇති අතර, බොහෝ විට ව්‍යාපාර අසාර්ථක වීම් දක්නට ලැබේ. මෙකී තත්වයට විසඳුමක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නිරත වන ව්‍යවසායකයින්ට සහ එකී ව්‍යාපාර ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් පසුවන්නන්ට අවශය මූලික දැනුම ලබාදීමේ අරමුණින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි කළමනාකරණ අධ්‍යයන පීඨය මගින් ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩ සටහන හඳුන්වා දී ඇත.

පාඨමාලාවේ අරමුණු

පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වනුයේ ජාතික ආර්ථිකයට සක්‍රියව දායක වන ව්‍යවසායකයින් පිරිසක් බිහි කිරිමට දායක වීමයි.

විශේෂිත අරමුණු

- සාර්ථක ව්‍යවසායකයකු බවට පත්වීමට අවශ්‍ය කරන දැනුම, කුසලතා හා ආකල්ප සහභාගී වන්නන් තුල වර්ධනය කිරීම.
- දැනුම සහ කුසලතාවයෙන් පරිපූර්ණ වු තරුණ තරුණියන් ස්වයං රැකියා අවස්ථා සඳහා දිරි ගැන්වීම.
- උගත් තරුණ තරුණියන්ට ලාභදායී ස්වයං රැකියාවක් කිරීමට අවස්ථාව ලබා දීම.
- ජාතික ආර්ථිකයට කැපී පෙනෙන දායකත්වයක් ලබා දිය හැකි නව්‍ය හා නිර්මාණශීලී කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් දිරිමත් කිරීම.

පාඨමාලා ව්‍යුහය

කාලය:
අධ්‍යයන වර්ෂ 01

මාධ්‍ය:
සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ (තමා තෝරාගත් මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීම සඳහා ප්‍රමාණවත් හැකියාවක් තිබිය යුතුය.)

ඇතුලත්වීමේ සුදුසුකම්:
අයදුම්පත් භාරදෙන අවසාන දිනට වයස අවු:18 හෝ ඊට වැඩිවීම සහ,

- දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා.පෙ) ගණිතය සහ භාෂාව ඇතුලුව විෂයන් හයක් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සමත්වීම, හෝ,

- විවෘත විශ්වවිද්‍යාලය මගින් මෙහෙයවන සම්මාන තිහක් සහිත පදනම් පාඨමාලාවක් හෝ උසස් සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිම කිරීම, හෝ,

- සනාථන සභාව විසින් පිළිගත් NVQF 3 මට්ටම හෝ උසස් සුදුසුකමක් ලබා තිබීම, හෝ,

- සනාතන සභාව විසින් පිලිගත් වෙනත් සමාන හෝ උසස් පාඨමාලාවක් සමත් වීම.

පාඨමාලා අන්තර්ගතය:
පාඨමාලා විෂයයන් අටකින් සමන්විත වේ.

| පාඨමාලා කේතය | විෂය | සම්මාන ප්‍රමාණය |
|---|---|---|
| OSC2401 | ව්‍යවසායකත්වය | 4 |
| OSC2402 | කුඩා ව්‍යාපාර කළමනාකරණය | 4 |
| OSC2303 | මූලික ගණිතය හා සංඛ්‍යානය | 3 |
| MMC2404 | ව්‍යවසායකයන් සඳහා අලෙවිකරණය | 4 |
| OSC2405 | ව්‍යවසායකයන් සඳහා මෙහෙයුම් කළමනාකරණය | 4 |
| AFC2406 | ව්‍යවසායකයන් සඳහා ගිණුම්කරණය සහ මූල්‍ය | 4 |
| OSC2407 | ව්‍යාපාර සැලැස්ම | 4 |
| AFC2308 | ආර්ථික විද්‍යාව හැඳින්වීමක් | 3 |
| මුළු සම්මාන ප්‍රමණය | | 30 |

ව්‍යාපාර සැලැස්ම සකස් කිරීමේදී අධ්‍යයන කාර්යමණ්ඩලයේ සාමාජිකයකු විසින් ශිෂ්‍යයාට මඟ පෙන්වනු ලබන අතර එමඟින් ශිෂ්‍යයාට තමන් කැමති ව්‍යාපාර අවස්ථාවක් හඳුනාගෙන ඒ සඳහා ව්‍යාපාර සැලැස්මක් සකස් කර ගත හැකිය. ව්‍යාපාර සැලැස්ම නියමිත වේලාවට ඉදිරිපත් කිරීම සහතිකය ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලැබීම සඳහා අවශ්‍ය වේ.

ඇගයීමේ ක්‍රමය:
ශිෂ්‍යයකුගේ නිපුණත්වය මිනුම් 4ක් මත අගයනු ලැබේ.

- අඛණ්ඩ පැවරුම්
- කුඩා පරිමාණයේ ව්‍යාපෘති
- ව්‍යාපාර සැලැස්ම
- අවසාන පරීක්ෂණය

පාඨමාලා ගාස්තු:
සම්පූර්ණ පාඨමාලා ගාස්තු පහත පරිදි වේ.

සම්පූර්ණ පාඨමාලා ගාස්තුව රු.30,000. ඔබට සම්පූර්ණ පාඨමාලා ගාස්තුව වාරික දෙකකින් ගෙවිය හැකිය.

1 වන වාරිකය රු .19, 200 (ලියාපදිංචි ගාස්තු හා පහසුකම් ගාස්තු ඇතුළුව)
2 වන වාරිකය Rs. 10, 800

විභාගය අසමත් වන සිසුන් නැවත ලියාපදිංචි විය යුතු අතර අසමත් විෂයයන් සඳහා නැවත ගාස්තුවක් ගෙවිය යුතුය.

සහතික ප්‍රධානය කිරීම:

අවසාන පරීක්ෂණය සාර්ථකව නිම කරන සිසුන් හට විවෘත විශ්වවිද්‍යාලයේ නීතිරීති වලට යටත්ව ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනකරණය පිළිබඳ සහතික පත්‍රය පිරිනැමෙනු ඇත.

තවද, පාඨමාලාව සාර්ථකව නිම කරන සිසුන් හට ඇතුලත් වීමේ පරීක්ෂණකයට භාජනය නොවී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි කළමනාකරණ අධ්‍යයන පීඨය මඟින් ප්‍රධානය කරනු ලබන කළමනාකරණ අධ්‍යයන ගෞරව උපාධි පාඨමාලාව සඳහා ඇතුලත් විය හැකිය.

## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පද්ධතිය පිළිබඳ අමතර තොරතුරු

- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල වාග් මාලාවට අනුව "විෂයයක්" යනුවෙන් අදහස් කරන්නේ සාමාන්‍යයෙන් එක් අධ්‍යයන වර්ෂයක් තුළ දී සම්පූර්ණ කරනු ලබන විෂය ක්ෂේත්‍රයකි.

- අනිවාර්යය සහ වෛකල්පිත විෂයයන් එකතුවෙන් "පාඨමාලාවක්" සෑදේ. අනිවාර්යය විෂයයන් යනු කිසියම් වැඩ සටහනක අවශ්‍යතා සපුරාලීම සඳහා ශිෂ්‍යයන් විසින් අත්‍යවශයෙන්ම සම්පූර්ණ කල යුතු වූ විෂයයන් වේ. පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා නිම කිරීම සහතිකයක්, ඩිප්ලෝමාවක් හෝ උපාධියක් ප්‍රදානය කරනු ලැබීමට සුදුසුකමක් වේ.

  විවෘත විශ්වවිද්‍යාලය මගින් ඉදිරිපත් කරන පාඨමාලාවන් පහත සඳහන් ප්‍රභේද අතුරින් එකකට අයත් වේ.

  - පදනම් වැඩ සටහන්
  - සහතික පත්‍ර
  - ඩිප්ලෝමා
  - ප්‍රථම උපාධි
  - පශ්චාත් උපාධි
  - දර්ශනශූරී උපාධි
  - වැඩිදුර අධ්‍යයන වැඩසටහන්

- පදනම් වැඩසටහන් සෙසු අධ්‍යයන වැඩසටහන්වලට ඇතුළුවීමේ දොරටුව වේ. මූලික අධ්‍යයන ක්ෂේත්‍රය තුල මෙම පදනම් වැඩ සටහන් පළමුවන (පදනම 1) සහ දෙවන (පදනම 2) යනුවෙන් මට්ටම් දෙකකින් පවත්වනු ලැබේ. විවෘත විශ්වවිද්‍යාලයීය පදනම් වැඩසටහන් සාර්ථක ලෙස සම්පූර්ණ කරන ශිෂ්‍යයෙක් සම්ප්‍රදායික විශ්වවිද්‍යාල වලට ඇතුළු වීම සඳහා අවශ්‍ය අධ්‍යාපන මට්ටමට සමාන මට්ටමකට එළඹෙයි.

- අක්ෂර තුනකින් සහ සංඛ්‍යා හතරකින් සමන්විත විෂයය කේතයන් පහත සඳහන් පරිදි එක් එක් විෂයයට ලබා දී ඇත.

  උදා: ලෙස **AFC2406, MMC2404, OSC2407**

  → පළමුවන අක්ෂරය දෙක මගින් අධ්‍යයන අංශය දැක්වේ. ( 1වන වගුවේ දක්වා ඇති පරිදි)

  → තුන්වන අක්ෂර හා පළමුවන සංඛ්‍යාංකය මගින් පාඨමාලා මට්ටම සහ වැඩ සටහන් ප්‍රභේදය දැක්වේ. (2 වන වගුවේ දක්වා ඇති පරිදි)

  → දෙවන සංඛ්‍යාංකය මගින් සම්මාන ප්‍රමාණය දැක්වේ.(3 වන වගුවේ දක්වා ඇති පරිදි)

  → අවසාන සංඛ්‍යාංකය දෙක මගින් අදාල දි ඇති සුවිශේෂ විෂයය අනුක්‍රමික අංකය දැක්වේ.

1වන වගුව: ඉදිරිපත් කරන දෙපාර්තමේන්තුව/ අධ්‍යයන අංශය

| අධ්‍යයන අංශය | කේතය |
|---|---|
| සංවිධාන අධ්‍යයන අංශය | OS |
| ගිණුම්කරණ හා මූල්‍ය අංශය | AF |
| අලෙවිකරණ කළමනාකරණ අංශය | MM |
| මානව සම්පත් කළමනාකරණ අංශය | HR |

2 වන වගුව: පාඨමාලා මට්ටම්

| අධ්‍යයන වැඩ සටහන | | | | | | වැඩිදුර අධ්‍යයන පාඨමාලා |
|---|---|---|---|---|---|---|
| මට්ටම | පදනම | සහතික පත්‍ර | ඩිප්ලෝමා | උපාධි | පශ්චාත් උපාධි | |
| 1 | F1 | C1 | | | | E1 |
| 2 | F2 | C2 | | | | E2 |
| 3 | | | D3 | U3 | | E3 |
| 4 | | | D4 | U4 | | E4 |
| 5 | | | | U5 | | E5 |
| 6 | | | | U6 | | E6 |
| 7 | | | | | P7 | E7 |
| 8 | | | | | P8 | E8 |
| 9 | | | | | P9 | |
| 10 | | | | | PA | |
| 11 | | | | | PB | |
| 12 | | | | | PC | |

3 වන වගුව: සම්මාන ප්‍රමාණය

| සම්මාන ප්‍රමාණය | **1** | **2/3** | **1/2** | **1/3** | **1/6** | **0** |
|---|---|---|---|---|---|---|
| කේතයේ දෙවන සංඛ්‍යාංකය | **6** | **4** | **3** | **2** | **1** | **0** |

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ක්‍රමය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් ශිෂ්‍යයන් වෙත දැනුම ලබාදෙනු ලබන්නේ දුරසථ අධ්‍යාපන ක්‍රමය මගිනි. මේ ක්‍රමයේදී ශිෂ්‍යයන් හා දේශකවරු වැඩි වශයෙන් දුරස්ථව සිටිති. අධ්‍යයන කටයුතු මුද්‍රිත පාඩම් කට්ටල, ශ්‍රව්‍ය දෘශ්‍යාධාර හා දින පාසල් මගින් සපුරා ගත හැකිවේ. දින පාසල් පැවැත්වීමේ අරමුණු වන්නේ සිසුන්ට සිය ආචාර්ය මණ්ඩලය හමුවී අධ්‍යයන ගැටළු විසඳා ගැනීමට සැලසීමයි. ශිෂ්‍ය සාධනය අගයනු ලබන්නේ අඛණ්ඩ ඇගයීම් හා අවසාන පරීක්ෂණ මගිනි.

මුද්‍රිත ද්‍රව්‍ය

දුරස්ථ ඉගෙනුම් ක්‍රමයෙහි ප්‍රධාන මාධ්‍යය වන්නේ ශිෂ්‍යයාට දෙනු ලබන මුද්‍රිත පොත් කට්ටලයයි. මේවායින් විවිධාකාර කාර්යයන් ඉටු කෙරේ. අධ්‍යයනය කළයුතු මූලික දේ එමගින් ශිෂ්‍යයාට සැපයේ. දේශන මගින් වන මෙහෙය ඉන් ඉටුවන අතර, කරුණු විශ්ලේෂණය කර අධ්‍යයනය කළයුතු විවිධ ක්‍රම සංසන්දනය කරමින් සැලකිල්ලෙන් සකස් කර ඇති ප්‍රශ්ණ මාලාවක්ද මේවායෙහි අඩංගුව ඇත. එමගින් අපේක්ෂා කෙරෙන්නේ ශිෂ්‍යන්ගේ ස්වාධින ලෙස සිතීමේ හැකියාව,ස්වාධීනව අධ්‍යයන කටයුතුවල නියැලීමේ හැකියාව සහ ශිෂ්‍ය ශිෂ්‍යවන්ගේ විශ්ලේෂණ ශක්තිය වැඩි දියුණු කිරීමයි.

ශ්‍රව්‍ය දෘශ්‍ය උපාංග

ශ්‍රව්‍ය දෘශ්‍ය උපාංග මඟින් සිසුන්ට වීඩියෝ චිත්‍රපට සහ කැසට්පට ලෙස අදාළ තොරතුරු නැරඹීමට සහ ශ්‍රවණයට අවස්ථාව ලබා දීම සිදු කරයි. OUSL කාර්ය මණ්ඩලය සහ විශේෂිත ක්ෂේත්‍රවල අනෙකුත් විශේෂඥයන් විසින් පවත්වනු ලබන දේශනයන්හි ශ්‍රව්‍ය කැසට් ඉදිරිපත් කිරීම්වලට සවන්දීමට අවස්ථාව ලබා දීම මගින්ද අධ්‍යයනය කටයුතු පුළුල් කරයි.

මාර්ගගත අතිරේක සහය

සිසුන්ගේ දැනුම වැඩි කිරීමේ අරමුණින් සහ නවීන ඉගෙනුම් මෙවලම් පිළිබඳව හුරු කරවීම සඳහා ESBM වැඩසටහනේ පාඨමාලාවන් මාර්ගගත අතිරේක ක්‍රමවේදය මගින් පවත්වගෙන යනු ලබයි. මෙම මාර්ගගත අතිරේක පද්ධතියට සිසුන්ට නිවසේ සිට හෝ ප්‍රාදේශීය / අධ්‍යයන මධ්‍යස්ථාන වල පිහිටි OUSL පරිගණක මධ්‍යස්ථාන වලින් ප්‍රවේශ විය හැකිය.

මාර්ගගත අතිරේක විෂයයන් සඳහා ප්‍රවේශ වීමට : http://learnousl.ou.ac.lk.

- පරිශීලක නාමය: ශිෂ්‍ය හැඳුනුම් අංකය ("s" වලින් ආරම්භ වන මෙම අංකය සඳහා වාර්තා පොතේ පුද්ගලික තොරතුරු බලන්න.)
- මුරපදය: ජාතික හැඳුනුම්පත් අංකය

දිවා පාසල්

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය දුරස්ථ අධ්‍යපන ක්‍රමයෙහි ලා මුද්‍රිත ද්‍රව්‍ය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය උපකරණ මූලික වන අතර, ඊට අමතරව ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානයන්හි දිවා පාසල් පවත්වනු ලබයි. මෙම දිවා පාසල් මගින් මූලික වශයෙන් විෂය කරුණු ආශ්‍රිතව පැන නගින ගැටළු නිරාකරණය කරදීම සිදු කෙරෙන අතර එහිදී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර

හා බාහිර ආචාර්ය මණ්ඩලය සමඟ මුහුණට මුහුණලා අධ්‍යයන ගැටළු සාකච්ඡා කිරීමට සිසුන්ට අවස්ථාව සැලසේ.

පැවරුම් හා විභාග

විශ්වවිද්‍යාලයේ පාඨමාලාවන් හදාරන සම්පූර්ණ කාල සීමාව තුළ ශිෂ්‍යයන්ගේ ඉගෙනුම් වැඩ කටයුතු නිරතුරුවම ඇගයීමට ලක් කරනු ලැබේ. ශිෂ්‍යයන් විසින් පැවරුම් කීපයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වන අතර ඒවා ලකුණු කොට උපදේශකවරයාගේ ගුණදොස් විවේචනයද සහිතව ශිෂ්‍යයන්ට ආපසු භාර දෙනු ලැබේ. මෙය "අඛණ්ඩ ඇගයුම" නමින් හැඳින්වේ. මෙම පැවරුම්වල ව්‍යුහය හා සංඛ්‍යාව අදාළ අධ්‍යන අංශය තීරණය කරන අතර පාඨමාලවෙන් පාඨමාලාවට සහ වසරින් වසරට මේවා වෙනස් විය හැක. සංවෘත ග්‍රන්ථ පරීක්ෂණ, විවෘත ග්‍රන්ථ පරීක්ෂණ, පැවරුම් (නිවසේ සිට පිළිතුරු සපයන), ව්‍යාපෘති යෝජනා යනාදී ස්වරූපයන්ගෙන් මෙම පැවරුම් සකස් විය හැකිය.

පාඨමාලාවක ලියාපදිංචි වීමෙන් පසුව තමන්ට සපයනු ලබන උපදෙස් පත්‍රිකාව සිසුන් විසින් කියවිය යුතු අතර අඛණ්ඩ අධ්‍යයන සහ අඛණ්ඩ ඇගයුම් වල වැදගත්කම අවබෝධ කරගත යුතුය. කිසිම ශිෂ්‍යයෙකුට යෝග්‍යතාවය ලබා ගැනීමෙන් තොරව වර්ෂ අවසාන විභාගයට පෙනී සිටීම සඳහා මෙම අධ්‍යයන වැඩසටහන් මගින් අනුබල දෙනු නොලැබේ. අඛණ්ඩ ඇගයීම් වලින් සාමාර්ථය නොලබන කිසිඳු ශිෂ්‍යයෙකුට/ ශිෂ්‍යාවකට අවසාන විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

සෑම පාඨමාලාවක් අවසානයේදී ම අවසාන පරීක්ෂණයක් පවත්වනු ලැබේ. අවසාන ශ්‍රේණිය තීරණය වන්නේ පැවරුම් හා අවසාන පරීක්ෂණය සඳහා ලබාගත් සමස්ථ ප්‍රතිපලය අනුවය. අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා යෝග්‍යතාවය නොලබන සිසුන් අදාළ පාඨමාලාව සඳහා නැවත ලියාපදිංචි විය යුතුය.

යෝග්‍යතාවය ලබා තිබුණද අවසාන පරීක්ෂණයෙන් අසමත් වන සිසුන්ට යලි අදාළ පාඨමාලාව සඳහා වන අවසාන පරීක්ෂණයට පමණක් පෙනී සිටීමට සිදුවේ. එනම් මෙම සිසුන්ට නැවත යෝග්‍යතාවය ලබා ගැනීම අවශ්‍ය නොවනු ඇත. නමුත් ඔවුන් ලියාපදිංචියේදී ශිෂ්‍යභාවය ලබාගත යුතුය.

ප්‍රාදේශිය සේවා

දිවයින පුරා විසිරුණු ප්‍රාදේශිය හා අධ්‍යයන මධ්‍යස්ථාන ජාලයක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සතුවේ. මෙම මධ්‍යස්ථාන මගින් දිවා පාසල් පැවැත්වීම, පුස්තකාල පරිශීලන පහසුකම් ලබා දීම, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ සේවා සැපයීම, මුද්‍රිත පතපොත ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය බෙදාහැරීම, විභාග පැවැත්වීම හා ශිෂ්‍ය උපදේශන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම ද කරනු ලැබේ. මෙම පහසුකම් නිරන්තරයෙන්ම වැඩි දියුණු කරනු ලබයි.

4 වන වගුව: විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන

| පිහිටීම | කේතය | ලිපිනය | දුරකථනය |
|---|---|---|---|
| කොළඹ | WP10 | නාවල, නුගේගොඩ. | **011-2853930 Ext. 380**<br>**Staff:281,630,**<br>**464,420,621** |
| නුවර | CP20 | පොල්ගොල්ල, මහනුවර. | 081-2494083/ 084<br>495/496 / 497 |
| මාතර | SP30 | නූපේ, මාතර. | **041-2222943**<br>**041- 2229782** |
| යාපනය | NP40 | බ්‍රවුනස් පාර, කොකුවිල්ල, යාපනය | **021-2223374** |
| අනුරාධපුර | NC50 | ජයන්ති මාවත, අනුරාධපුරය | **025-2222871** |
| මඩකලපුව | EP60 | නො.23, අලුත් පාර, මඩකලපුව. | **065 2222264** |
| බදුල්ල | UP80 | නො. 179 කැප්පැටිපොල පාර, බදුල්ල | **055 3012151**<br>**055 2228842** |
| රත්නපුර | SG90 | හිදෙල්ලෙන, රත්නපුර. | **045 2228660** |

5 වන වගුව: විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන මධ්‍යස්ථාන

| පිහිටීම | කේතය | ලිපිනය | දුරකථනය |
|---|---|---|---|
| අම්බලන්ගොඩ | **SP31** | 80/1, පොල්වත්ත පාර, හල්වතුර, අම්බලන්ගොඩ | **091-2258585** |
| අම්බලන්තොට | **SP33** | රාජසරණගම පාර, දකුණු ලුනම, අම්බලන්තොට. | **047-2225533** |
| අම්පාර | **EP61** | ඉගිනියාගල පාර, සාමපුර, අම්පාර. | **063-2222052** |
| බණ්ඩාරවෙල | **UP81** | ශාන්ත තොමස් මාවත, වැවතැන්න, බණ්ඩාරවෙල. | **057-2222820** |

| පිහිටීම | කේතය | ලිපිනය | දුරකථනය |
|---|---|---|---|
| ගාල්ල | **SP32** | ලබුදූව, ගාල්ල. | **091-2223784** |
| ගම්පහ | **WP11** | ගම්පහ පාර, මිරිස්වත්ත,<br>මුදුන්ගොඩ. | **033-2234571**<br>**033-2234572** |
| හැටන් | **CP21** | ශාන්ත ගේබ්‍රියල් කන්‍යාරාමය,<br>හැටන්. | **051-2225139** |
| කළුතර | **WP12** | 66/2, නාගොඩ පාර, කළුතර. | **034-2223399**<br>**034-2223286** |
| කෑගල්ල | **SG91** | කුමාරතුංග මුණිදාස මාවත,<br>කෑගල්ල. | **035-2222501** |
| කිලිනොච්චිය | **NP42** | 155 වෙනි සැතපුම් කණුව, නුවර<br>පාර, කිලිනොච්චිය. | **021 2283970** |
| කුලියාපිටිය | NW72 | ලයනල් ජයතිලක මාවත,<br>කුලියාපිටිය. | 037-3133655 |
| මන්නාරම | **NP44** | ආර්ඩීඑස් ගොඩනැගිල්ල,<br>සුළු සෙමිනරි පාර,<br>චාවට්කඩු, මන්නාරම. | **023-2251999** |
| මොණරාගල | **UP82** | කාර්මික විද්‍යාල හන්දිය, සිරිගල<br>පොල්විල් පාර, මොණරාගල. | **055-2277395** |
| මුලතිව් | **NP43** | ඔඩ්ඩුසුඩාන් පාර, පුතුකුඩීඉරුප්පු,<br>මුලතිව්. | **021 - 2290868** |
| පොළොන්නරුව | **NC51** | 24 කණුව, බෙන්ඩිවැව,<br>ජයන්තිපුර,පොළොන්නරුව. | **027-2225776** |
| පුත්තලම | **NW71** | 1/137, කොළඹ පාර, පුත්තලම. | **032-2266822** |
| වව්නියාව | **NP41** | නො.366, නුවර පාර,<br>තේක්කවත්ත, වව්නියාව. | **024-2222995** |
| ත්‍රිකුණාමලය | **EP62** | නො 26/ඒ, තැපැල් කාර්යාල<br>මාවත, තිකුණාමලය. | **026-2222088** |

| පිහිටීම | කේතය | ලිපිනය | දුරකථනය |
|---|---|---|---|
| මාතලේ | CP03 | No.09, MC පාර, මාතලේ | 066-2058083 |
| කුරුණෑගල | NW70 | මීගමුව පාර, (නිශ්ශංක මාවත හන්දිය) මල්කඩුවාව, කුරුණෑගල. | 037 2223473 |

- පුස්තකාල පහසුකම්

විශ්වවිද්‍යාලයීය කොළඹ ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ හා අනෙකුත් මධ්‍යස්ථානවල පුස්තකාල පහසුකම් සලසා තිබේ. ඉහළ මට්ටම් වලට අවශ්‍ය වන ආශ්‍රිත ග්‍රන්ථ ආදිය සඳහා පහසුකම් නාවල මධ්‍යම පුස්තකාලයෙන් සැපයෙනු ඇත. පුස්තකාල පහසුකම් පරිහරණය කිරීම සඳහා සිසුන්ට විශේෂයෙන්ම උපදෙස් දෙනු ලබන්නේ එය අධ්‍යාපන ක්‍රමයේ ඉතා වැදගත් අංගයක් බැවිනි. විශ්වවිද්‍යාලයීය ප්‍රාදේශිය මධ්‍යස්ථානයන්හි කිසියම් හෝ පුස්තකාල පහසුකමක් සලසා දීම සඳහා උපරිම පරිශ්‍රමයක් දරා තිබේ. කෙසේ නමුත් උපරිම පහසුකම් නාවල මධ්‍යම පුස්තකාලයේ ඇති බැවින් එය පරිශීලනය කිරීමට සිසුන්ට අනුබල දෙනු ලැබේ.

විවෘත විශ්වවිද්‍යාලයීය පුස්තකාලය සාම්ප්‍රදායික අධ්‍යයන පුස්තකාල මගින් වෙනස් වන්නේ එමගින් දිවයින පුරා විසිරි සිටින සිසුන් විශාල සංඛ්‍යාවකගේ අවශ්‍යතාවයන් සඳහා පහසුකම් සපයන බැවිනි. ඒ අනුව, විවෘත විශ්වවිද්‍යාලයීය පුස්තකාල ක්‍රමය මගින් ආශිත ග්‍රන්ථ පරිශීලනය කිරීමේ හා පොත්පත් බැහැර ගෙන යාමේ පහසුකම් කාර්ය මණ්ඩලය වෙත සලසා ඇති අතර පසු දින ආපසු භාරදීමේ පදනම මත පොත් බැහැර ගෙන යාමේ සීමිත පහසුකම් සිසුන් වෙත
සැපයේ.කෙසේ නමුත්, ආශිත ග්‍රන්ථ පරිශීලනය කිරීම සඳහා විවෘත විශ්විද්‍යාලය සිසුන් විසින් වෙත සලසා ඇති පහසුකම් සීමා කර නොමැත.

ගාස්තු හා වෙනත් වියදම්

අධ්‍යයන වැඩසටහනක් සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවෙකුට ලියාපදිංචි වීමේදී ශිෂ්‍ය උපදේශන ගාස්තු සහ ඒවා ගෙවිය යුතු දින සඳහන් වවුචරයක් ලැබෙනු ඇත. නියමිත දින හෝ ඊට පෙර ගාස්තු නොගෙවුවහොත් පාඨමාලා සඳහා ලියාපදිංචි කරනු නොලැබේ.

ඉල්ලුම් කරනු ලැබූ අවස්ථාවේදීම අදාල ශිෂ්‍ය උපදේශන ගාස්තු ගෙවිය යුතුවන අතර එය අප්‍රමාදීව සිදුවිය යුතු වේ. පූර්ව දැනුම් දීමකින් තොරව ඕනෑම අවස්ථාවක මෙම ගාස්තුව හා අනෙකුත් සියලුම අයකර ගැනීම් සංශෝධනය කිරීමේ බලය විශ්වවිද්‍යාලය සතුවේ. ගෙවන ලද ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

නේවාසික හෝ දිවා පාසල් ගාස්තු ශිෂ්‍ය උපදේශන ගාස්තුව තුල ඇතුලත්ව නොමැතිවාක් මෙන්ම නියමිත ග්‍රන්ථ සඳහා වියදම් හෝ ශිෂ්‍යයෙකු ඔහුගේ අධ්‍යයන කටයුතු වලදී දරන්නාවූ අනියම් වියදම් එහි ඇතුලත් කර නොමැත.

ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය දැක්වෙන වවුචර් වල එම ගාස්තු ගෙවිය යුතු ක්‍රමය සඳහන් කෙරෙනු ඇත. ශිෂ්‍ය උපදේශන ගාස්තු වාරික දෙකකින් ගෙවිය හැක. පළමුවන වාරිකය ලියාපදිංචි වන දින ගෙවිය යුතුය.

පාඨමාලා ගාස්තු වශයෙන් දක්වා ඇති අගයට වාර්ෂිකව 10% බැගින් එකතුවන බව සිසුන් මතක තබා ගත යුතුය. එමෙන්ම යම් සිසුවෙක් කිසියම් පාඨමාලාවක් සඳහා යෝග්‍යතාවක් ලැබීමට අසමත් වී ඒ සඳහා නැවත ලියාපදිංචි වන්නේ නම් අදාල පාඨමාලා ගාස්තුව මෙන් දෙගුණයක් ගෙවිය යුතු වේ.

ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් හැදැරීමට අපේක්ෂා කරන සිසුන් අදාළ ලියාපදිංචිය සිදු කරන කාල සීමාව තුළ නියමිත ගාස්තු ගෙවා ලියාපදිංචිය ලබා ගැනීම අවශ්‍ය වේ.

සිසුන් විසින් තෝරාගනු ලබන විෂයය ක්ෂේත්‍ර පිළිබඳ ශිෂ්‍ය උපදේශන කටයුතු ලියාපදිංචිය සිදු කරන අවස්ථාවේදි පැවැත්වෙන බැවින් ලියාපදිංචි වීම සඳහා අදාළ සිසුන්ගේ සහභාගීත්වය අවධාරණය කෙරේ.

ලියාපදිංචිය සඳහා අදාළ ශිෂ්‍යයා/ ශිෂ්‍යාවට පැමිණිය නොහැකි අවස්ථාවකදී ඔහු/ ඇය නියෝජනය කිරීම සඳහා බලය පවරනු ලැබූ වෙනත් පුද්ගලයෙකු මගින් ලියාපදිංචි සිදුකර ගැනීමට හා අදාළ අනෙකුත් විස්තර ලබා ගැනීමට අවකාශ ඇත.

සිසුන් ලියාදිංචි කිරීම ප්‍රාදේශිය මධ්‍යස්ථාන වලදී සහ තෝරාගත් අධ්‍යයන මධ්‍යස්ථාන වලදී සිදු කෙරේ. කෙසේ වෙනත් කිසියම් මධ්‍යස්ථානයක ශිෂ්‍ය ලියාපදිංචිය සිදු කිරීම එකී මධ්‍යස්ථානය තෝරා ගෙන ඇති ශිෂ්‍ය සංඛ්‍යාව මත තීරණය වේ.
වර්තමානයේදී, ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන්නේ මාර්ගගත පද්ධතියක් මගිනි. ලියාපදිංචිය සැකසීම සඳහා පද්ධතිය තුළ ඔබේ පැතිකඩ සක්‍රිය කිරීමේ මූලික මාර්ගෝපදේශය ඇමුණුම් වලින් දක්වා ඇත.

එක් අධ්‍යයන වර්ෂයක් සඳහා කිසියම් ශිෂ්‍යයෙකුට ලියාපදිංචිය ලබාගත හැකි පාඨමාලාවන්ගේ අවම හා උපරිම සීමාවක් විශ්වවිද්‍යාලය මගින් නියම කර ඇත. ඒ අනුව එක් අධ්‍යයන වර්ෂයක් සඳහා සම්මාන 37 ක උපරිමයකට යටත්ව අධ්‍යයන පාඨමාලාවන්ට (අඛණ්ඩ අධ්‍යයනය යටතේ පරිගණක වැනි වැඩ සටහන් වලට) ලියාපදිංචි වීමට අවසරය ඇත.
(එනම්, සාමාන්‍ය වැඩසටහන් 2ක උපරිම සම්මාන 30 කට යටත්ව හා වැඩිදුර අධ්‍යයන පාඨමාලා සඳහා උපරිම සම්මාන 7 කට යටත්ව)

එකවර අධ්‍යයන වැඩසටහන් දෙකක් සඳහා ලියාපදිංචි වන ශිෂ්‍යයෙකුට අධ්‍යයන කටයුතු හා විභාග සම්බන්ධව යම් අපහසුතාවයන් ඇතිවීමට ඉඩ ඇති අතර එවැනි අපහසුතාවයක් පිළිබඳව විශ්වවිද්‍යාලය කිසිඳු වගකීමක් දරනු නොලැබේ. කෙසේ වෙතත් පළමුවර ලියාපදිංචි වන අවස්ථාවේදී හුදෙක් ශිෂ්‍යභාවය සඳහා පමණක් ලියාපදිංචි වීමට (පාඨමාලාවන් සඳහා ලියාපදිංචි නොවී) කිසිඳු ශිෂ්‍යයෙකුට අවසර දෙනු නොලැබේ. ඔහු/ ඇය එම අවස්ථාවේදී යටත් පිරිසෙයින් සම්මාන 8 ක් වන පරිදි පාඨමාලා සඳහා ලියාපදිංචි විය යුතුය. අනෙකුත් සියලුම අධ්‍යයන වැඩසටහන් සඳහා ලියාපදිංචි වීමේ අවසන් දිනයේ සිට මාස 7 ක් දක්වා ශිෂ්‍යභාවය ප්‍රදානය කෙරේ. එහිදී සිසුන්ට අවසාන විභාගයට පෙනී සිටීමට ඉඩ නොදේ.

**විෂයයන් වෙනස් කිරීම්**

ලියාපදිංචි වූ පසු ශිෂ්‍යයෙකුට විෂයයන් එකතු කිරීමට හෝ අතහැර දැමීමට අවසර ඇත. කෙසේ වෙතත්, එවැනි වෙනස් කිරීම් සඳහා අවසර දී ඇත්තේ අධ්‍යයන වැඩසටහන මඟින් නිශ්චිතව දක්වා ඇති එකතු කිරීමේ / අතහැර දැමීමේ කාල සීමාව තුළ පමණක් බව සැලකිල්ලට ගත යුතුය.

## වැඩිදුර විමසීම්

**ESBM කමිටුව**

**ඩී.කේ. සෙව්වන්දි**
**ප්‍රධාන සම්බන්ධිකාරකතුමිය**

දුරකථන අංක: 0112 881024/ 0112 881255

**ජේ.පී.ආර්.මලීෂා**
ව්‍යාපෘති සහකාර

දුරකථන අංක: 0112 881024/ 0112 881255/0716393714
Email: esbm@ousl.lk

**එම්.කේ.ඕ.මුණසිංහ**
ව්‍යාපෘති සහකාර

දුරකථන අංක: 0112 881024/ 0112 881255/0716393714
Email: esbm@ousl.lk

තැපැල් ලිපිනය:-

වැඩසටහන් සම්බන්ධිකාරකතුමිය,
ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර කළමනාකරණ
උසස් සහතික පත්‍ර වැඩසටහන,
සංවිධාන අධ්‍යයන අංශය,
කළමනාකරණ අධ්‍යයන පීඨය,
**PO Box 21,**
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය,
නාවල,නුගේගොඩ.

## The Faculty

Prof. N. Abeysekera
[B.Sc.Marketing (Sp)(Hons)(USJ),
MBA in Marketing (Colombo),
PhD (Colombo),
MCIM, MSLIM, PGD in MKT (UK),
MAAT, Intermediate (ICASL)
Dip in CMA]
Dean/ / Faculty of Management Studies
Professor in Management Studies
E-mail: nabey@ou.ac.lk
Telephone: 0112881408

Prof. V. Sivalogathasan
[B.Com(Sp)(Hons) (PDN), MBA(IB)(AIT,Thailand), PhD (ZJU)]
Professor in Management Studies
E-mail: vsiva@ou.ac.lk
Telephone: 0112881255

Prof. L.P.S Gamini
[BSc. Business Administration (Sp)(Hons) (USJ), MCom(KLN), PhD (Delhi)]
Professor in Accounting & Finance
E-mail: lpgam@ou.ac.lk
Telephone: 0112881255

Dr S.S.K. Edirisinghe
[B.Com (Sp)(Hons)(KLN), MCom(KLN),
Certificate in Int.Busi. (AIT-Thailand)
PhD (KLN)]
Head/ Department of Organizational Studies
Senior Lecturer (Gr. I)
E-mail: ssedi@ou.ac.lk
Telephone: 0112881143

Mr. S.A.D. Senanayake
[B.Sc (Sp)(Hons)(KLN), MBA(Delhi)]
Senior Lecturer (Gr.I)
E-mail: sasen@ou.ac.lk
Telephone: 0112881142

Dr. S. J. M. P. U. Seneviratne
[BBA.(CBO), M.Sc. in Management (USJ),
PhD(Leicester)]
Senior Lecturer (Gr. I)
E-mail : sjsen@ou.ac.lk
Telephone: 0112881142

Mr. K.P. Nishantha
[B.Sc. Financial Management.
(Hons)(SUSL),
M.Sc. in Management (USJ),
CTHE, Certified Trainer]
Head/ Department of Human Resource Management.
Senior Lecturer (Gr I)
E-mail: kpnis@ou.ac.lk
Telephone: 0112881434

Prof. (Ms) H.D.D.C.Liyanagamage
[BSc.Management (Sp)(Hons) (USJ),
MBA in Finance(Colombo),
Intermediate (ICASL),
PhD(Colombo) ,FCPM]
Head/ Department of Accounting & Finance
Professor in Accounting & Finance
E-mail: hdcha@ou.ac.lk
Telephone: 0112881424

Dr. S. Sapukotanage
[BBA (Colombo), M.Sc. in Management.
(USJ),PhD (USJ)]
Head/Department of Marketing Management
Senior Lecturer (Gr. II)
E-mail: ssapu@ou.ac.lk
Telephone: 0112881413

Mr. K.P.J.M. Pathirana
[BMS(HRM)Sp. (Hons)OUSL,
M.Com (KLN)]
Senior Lecturer - G.II
E-mail: kppat@ou.ac.lk
Telephone: 0112881255

Mr. H.M.J.C.B. Heenkenda
[BBA. Enterprenurship (Sp)(URSL)],
M.Sc.in Management(USJ)]
Senior Lecturer (Gr.II)
E-mail: hmhee@au.ac.lk

Mr. C.P. Weerasekara
[B.Sc. Financial Management (Sp)(SUSL),
M.Sc.in Management(USJ)]
Senior Lecturer (Gr.II)
E-Mail: cpwee@ou.ac.lk
Telephone: 0112881140

Mr.W.A.R. Senevirathne
B.Sc.Accountancy and Finance (Sp)
(WUSL),MBA(WUSL),
MAAT,CASL,Final,CBF ]
Senior Lecturer (Gr.II)
E-Mail: wasen@ou.ac.lk
Telephone: 0112881255

Ms. G.A.J Silva
[B.Sc. Business Administration (Sp)(USJ),
MCom (KLN)]
Lecturer
E-mail: gasil@ou.ac.lk
Telephone: 0112881023

Ms. S. Manoshika
[B.B.Mgt. Human Resource Management
(Sp)(KLN), B.Sc. Applied Accounting (OBU),
MBA (PIM), ACCA Finalist]
Lecturer
E- Mail: smano@ou.ac.lk
Telephone: 0112881023

Ms. J. C. Hapugoda
[B.Sc. Statistics with Computer Science (Sp)(CBO),
MFE (CBO), CIMA (UK)Passed Finalist]
Lecturer (Probationary)
E-Mail: jchap@ou.ac.lk
Telephone: 0112881140

Ms. A.A.I. Lakmali
[B.Sc. Marketing Management (Sp.)(USJ),
M.Sc. in Management (USJ)]
Lecturer (Probationary)
E- Mail: aalak@ou.ac.lk
Telephone: 0112881024

Ms. A. H.U. Perera
[B.B.Mgt. Human Resource Management
(Sp)(KLN), MBA (PIM)
CIMA Passed Finalist]
Lecturer (Probationary)
E- Mail: ahper@ou.ac.lk
Telephone :0112881023

Ms. D.K. Sewwandi
[B.Sc.Business Administration
(Sp) USJP, PGD in Management(RUSL),
MBA(KLN)]
Lecturer (Probationary)
Programme coordinator-ESBM
E-Mail: dksew@ou.ac.lk
Telephone :0112881024

Mr. T.H. Rathnayake
[B.Sc. Marketing Management (Sp) (USJ)]
Temporary Lecturer
E-Mail: thrat@ou.ac.lk
Telephone:0112881413

Ms. R.H.A.T. Perera
[B.Sc. Marketing Management (Sp)
(EUSL)]
Temporary Lecturer
E-Mail: rhper@ou.ac.lk
Telephone:0112881413

Ms. M.G.C.D. Mahakumbura
[BSc. Business Information Systems (Sp)
(USJ)]
Temporary Lecturer
E-Mail: mgmaha@ou.ac.lk
Telephone:0112881024

Ms. P.D. Dananjani Kasunika
[B. Com (Sp.) in Financial Management
(KLN)]
Temporary Assistant Lecturer
E-Mail: danapayagala@gmail.com
Telephone:0112881025

Ms.R.P.D.N.Ranasinghe
Attorney –at-law
[LLB (OUC)LLM (NALSAR University-
India), Dip.in Diplomacy & word Affairs
(BIDTI)]
Lecturer (on contract)
E-Mail: rpran@ou.ac.lk
Telephone :0112881024

Dr.S.M.D.C.W Senarathne
[PhD(Industrial Economics),WHUT,China,
MBA (Finance) CBO, B.Sc. HRM (Sp),USJ
ACA,ACMA (UK), CGMA]
E-Mail: smdse@ou.ac.lk
Telephone :0112881413

Ms.H.M.J.S.Herath
[B.Sc Finance (Sp)(USJ)
CIMA Passed Finalist, ACCA Passed Finalist
Master of Financial Economics(Merit)]
Lecture (On Contract)
E-Mail: hmjsh@ou.ac.lk
Telephone :0112881023

Ms.M.Sampavi
[BBA (Hons)(Sp) in Financial Management (UOJ)
AAT Passed Finalist]
Lecturer (on contract)
E-Mail: msamp@ou.ac.lk
Telephone :0112881023

Ms.A.Sumaiya
[B.B.Mgt,Human Resource Management (Sp)(KLN)]
Lecturer (on contract)
E-Mail: asuma@ou.ac.lk
Telephone :0112881413

Ms.M.A.D.A.Samali
[BBA (Marketing) (Sp) (CBO), Pg. Dip in Marketing (CIM-UK), DDMP (SLIM)]
Lecturer (on contract)
E-Mail: msamp@ou.ac.lk
Telephone :0112881413

Ms.S.M.H.D.Samarakoon
BMS(Hons) OUSL
Lecturer (on contract)
E-Mail: smhsa@ou.ac.lk
Telephone :0112881413

Ms.P.N.Gamaethige
[B.Sc. Business Administration (Sp) (USJ), Certified Business Accountant (ICASL)]
Lecturer (on contract)
E-Mail: pngam@ou.ac.lk
Telephone :0112881024